**ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 26 - 2022**

-----------------------------------------------------------------------

## 1. විගණන මතය

1.1 ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 26 හි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2022 වර්ෂයට අදාලව ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 26 කට අදාලව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම වාර්තාවල කාරක සභා 26 හිම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඊට හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොවිජන බැංකුව ගොවිජන සංවර්ධන කාරක සභාවේ ඒකකයක් බැවින් ගොවිජන බැංකුවට අදාළ සියළුම ගිණුම් ගොවිජන කාරක සභාවේ වාර්ෂික ගිණුම්වලටද ඇතුළත් කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, කාරක සභා 26 ම එසේ කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 04/2012 සහ 2012 පෙබරවාරි 29 දිනැති චක්‍රලේඛයේ 5.6(i) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කෙරේ. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 04/2012 සහ 2012 පෙබරවාරි 29 දිනැති චක්‍රලේඛයේ 5.6(i) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ප්‍රමිත අංක 07 හි 26 වන වගන්තිය අනුව කාරක සභා 26 හිම කාරක සභාව පිහිටුවා ඇති ඉඩම හා ගොඩනැගිල්ලෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හා ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳව දැනුවත් නොවීම හා ඊට අනුකූලව ඉදිරියේදී කටයුතු කෙරේ. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හා ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

(අ) ගොවිජන සේවා කාරක සභා 26 හිම ඉඩම් පිරිවැය හෝ තක්සේරු වටිනාකම කාරක සභාවට අයත්

| | | |
|---|---|---|
| හා ගොඩනැගිලි ද, කාරක සභා 5 කට අදාලව පරිගණක උපාංග හා ජායා පිටපත් යන්ත්‍රයද එසේම කෘෂි වාහන හා උපකරණවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | සියලු වත්කම් තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) ගොවිජන සේවා කාරක සභා 08 ක එකතුව රු. 61,406 ක් වියදම් වැඩියෙන්ද , කාරක සභා 03 ක එකතුව රු.1,318,281 ක් ආදායම් වැඩියෙන් සහ කාරක සභා 04 ක රු.75,352 ක් වූ ආදායම් අඩුවෙන් ද ගිණුම්ගත කර තිබුණි. එසේම කාරක සභා 05 ජංගම වත්කම් 295,289 ක් වැඩියෙන්ද කාරක සභා 02 ක ජංගම වත්කම් රු.172,002 ක් වූ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. එසේම කාරක සභා 07 ක රු.1,452,117 ක්වූ ජංගම බැරකම් අඩුවෙන් ද තවත් කාරක සභා 04 ක ජංගම නොවන වත්කම් රු.958,500 ක් වැඩියෙන් දැක්වීම්ද, තවත් කාරක සභා 02 ක ජංගම නොවන වත්කම් රු.403,520 ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි. | මෙම දෝෂයන් 2023 වර්ෂයේ ජනවාරි මස ගිණුම්වලට ගලපා 2023 වර්ෂයේ ගිණුම් වාර්තාවල නිවැරදිව දැක්වීමට කටයුතු කරමි. | මූලා‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් වර්ෂයට අදාළ ආදායම් හා වියදම් ගැලපීමටත්, මූලා‍ය ප්‍රකාශන සම්පූර්ණ හා නිවැරදිව ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) ගොවිජන සේවා කාරක සභා 07 කට අදාලව ක්ෂය අවසන් කර තිබූ පරිගණක 04, පරිගණක පද්ධතියන්, පරිගණක උපාංග, යන්ත්‍රෝපකරණ, ප්‍රින්ටරයක්, වතුර මෝටරයක්, බිම් තරාදියක් යන ස්ථාවර වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂයේදී පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුයි. |

### 1.3.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධායක ලේකම්ගේ අනුමැතිය තොරවූ ගොවිජන සේවා කාරක සභා 04 ක එකතුව රු.91,670 ක්වූ ගෙවීම් වවුචර් 37 ක් මගින් ගෙවීම් සිදුකර තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ගෙවීම් වවුචර් නිසි අනුමැතියක් සහිතව ගෙවීම් සිදුකිරීමට යොදාගත යුතුයි. |

### 1.3.3 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 05 කට අයත් රු.984,174 ක්වූ ගිණුම් ශේෂවලට අදාල ශේෂ සනාථ කිරීම්, ඇප තැන්පත් ලේඛණ, ස්ථාවර තැන්පත් සහතික වැනි සාක්ෂීන් විගණනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් එම ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ප්‍රමාණවත් තොරතුරු නොමැතිබව දන්වා තිබුණි. | වත්කම් සහ වගකීම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.4 නීති රීති රෙගුලාසි සහ කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| 52 වගන්තිය | සෑම කන්නයටම පෙරාතුව ගොවිජන කාරක සභා බල ප්‍රදේශය සඳහා කෘෂිකාර්මික වැඩසටහනක් පිළියෙල කළ යුතු වුවත්, කාරක සභා 26 විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පනතේ 52(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කරන මෙන් ප්‍රාදේශීය නිලධාරීට ලිඛිතව උපදෙස් ලබාදීමට කටයුතු කරමි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 133 හා 134 වගන්ති | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් හෝ වගකිවයුතු නිලධාරියෙකු ගොවිජන කාරක සභාව පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර එම වාර්තාවල පිටපත් ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 880 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ II කොටසේ 09 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 56 කට අදාලව මුදල් හෝ තොග සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා බලය ලබා දී ඇති සියලුම සේවකයින් විසින් ඇප තැබිය යුතු වුවද, සංවර්ධන නිලධාරී, විධායක ලේකම්, ගොවි බැංකු ලිපිකරු, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවන් ඇප තබා නොතිබුණි. | ඇප තැන්පත් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ පියවර ගන්නා බව දන්වමි. | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව සහ 01/2020 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ** | | | |
| | 2013 මාර්තු 08 දිනැති 04/2013 චක්‍රලේඛය | ගොවිජන සේවා මධ්‍යස්ථාන පරිශ්‍රය උපයෝගී කර ගනිමින් ගොවි නිෂ්පාදන අලෙවිය, තාවකාලික ආපනශාලා පැවැත්වීම, ගොවි සංවිධානවල නිෂ්පාදන අලෙවිකිරීම වැනි කටයුත කරන ලෙස උපදෙස් දී තිබුණද, ගොවිජන සේවා කාරක සභා බොහොමයක් එසේ කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2022 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 23 හි එකතුව රු.13,295,888 ක අතිරික්තයක් ද, ගොවිජන බැංකු 26 ක එකතුව රු.7,148,416 ක අතිරික්තයක්ද විය. 2021 වර්ෂයේදී ගොවිජන සේවා කාරක සභා 22 ක එකතුව රු.8,765,390 ක අතිරික්තයක්ද, ගොවිජන බැංකු 26 ක එකතුව රු.6,855,346 ක අතිරික්තයක් ද විය.

#### 2.1.1 විශ්ලේෂණාත්මක සමාලෝචනය

i. සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 23 ක රු.13,295,888 ක අතිරික්තයක් ලබාගෙන තිබූ අතර ඊට සාපේක්ෂව පෙර වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 22 ක අතිරික්තය රු.8,765,390

ක් විය. ඒ අනුව රු.4,530,498 ක් අතිරික්තයේ වැඩිවීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ කාරක සභා 03 ක ඌනතාවය රු.481,850 ක් වූ අතර ඊට සාපේක්ෂව පෙර වර්ෂයේ කාරක සභා 04 ක ඌනතාවය රු.469,463 ක් විය. ඒ අනුව ඌනතාවයේ වැඩිවීම රු.12,387 ක් වුවද, අතිරික්තයේ වැඩිවීම ගැලපීම නිසා සමස්ථ අතිරික්තය රු.4,518,111 කින් වැඩි වී තිබුණි.

ii. ගොවිජන සේවා කාරක සභාවල මූලික කාර්යභාරයක් ලෙස පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය, බීජ හා පැළ, කෘෂි උපකරණ ඇතුළු කෘෂිකාර්මික භාණ්ඩ අලෙවි කිරීම වන අතර සමාලෝචිත වර්ෂයට අදාළව ගොවිජන සේවා කාරක සභා 26 ම මුළු අලෙවියේ එකතුව රු.37,910,713 ක් විය. මුළු දළ ලාභය එකතුව රු.12,109,119 ක් වූ හෙයින් ඒ අනුව එක් ගොවිජන සේවා කාරක සභාවක වාර්ෂික අලෙවි වටිනාකම සාමාන්‍ය රු.1,458,104 ක් වූ අතර සාමාන්‍ය දළ ලාභය රු.465,735 ක් විය.

iii. ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 26 මූල්‍ය තත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| | ---- |
| <u>මුළු වත්කම්</u> | |
| ජංගම වත්කම් | 142,704,377 |
| ජංගම නොවන වත්කම් | 94,773,675 |
| <u>මුළු වගකීම්</u> | |
| ජංගම බැරකම් | 76,862,118 |
| දිගුකාලීන ණය වටිනාකම | 4,645,264 |
| සමුච්චිත අරමුදල් වටිනාකම (ශුද්ධ වත්කම්) | 155,970,670 |

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 තැන්පත් ගිණුම් පිළිබඳ තොරතුරු සහ ඵලදායී ආයෝජනයක යොදවා නොතිබීම**

2022 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 26 ක් හා ගොවිජන බැංකු 26 ක් විසින් රජයේ වානිජ බැංකු 02 හි පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම්වල පැවැති ශේෂයන් හා රජයේ බැංකුවල ඉතුරුම් හා ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර ඇති මුදල පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| | ඉතුරුම් තැන්පතු | ස්ථාවර තැන්පතු | ජංගම තැන්පතු | එකතුව |
|---|---|---|---|---|
| කාරක සභා | 2,123,231 | 64,719,748 | 59,656,774 | 126,499,753 |
| ගොවිජන බැංකු | 29,880,717 | 34,759,636 | 4,290,573 | 68,930,926 |
| | --------------- | --------------- | --------------- | ------------------ |
| එකතුව | 32,003,948 | 99,479,384 | 63,947,347 | 195,430,675 |
| | ========= | ========= | ========= | ========== |

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කිසිදු පොලී ආදායමක් නොලබන ජංගම ගිණුම්වල පැවති ශේෂ රු.63,947,347 කි. | ගොවිජන සේවා කාරක සභාවල එදිනෙදා කටයුතු සඳහා ප්‍රමාණවත් මුදල් ශේෂයක් තබාගත යුතු බැවින් මෙසේ මුදල් ජංගම ගිණුමේ තබා ඇත. | අරමුදල් වඩාත් ඵලදායී ආයෝජන මාර්ගයක යෙදවිය යුතුය. |
| (ආ) අඩු පොලී ආදායමක් ලැබෙන ඉතුරුම් තැන්පතුවල ආයෝජනය කර ඇති මුදල් එකතුව රු.32,003,948 කි. ඒ අනුව මුදල් ඵලදායී ලෙස යොදවා නොතිබුණු බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලැබී නැත. | අරමුදල් වඩාත් ඵලදායී ආයෝජන මාර්ගයක යෙදවිය යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ පවතින රු.21,675 ක පොහොර ඌණතාවයට වගකිවයුතු හිටපු අලෙවි ලිපිකරුගෙන් වසර 03 ට වඩා වැඩි කාලයක් සිට රු.21,675 ක වටිනාකමක්ද එසේම වසර 13 කට වඩා වැඩි කාලයක සිට පැවතෙන තොග ඌනතාවය වෙනුවෙන් අයවිය යුතු රු.528,722 ක මුදලක් අයකරගත නොහැකිව පැවතුනි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ආ) පල්ලෙවෙල ගොවිජන සේවා කාරක සභාවේ හිටපු අලෙවි ලිපිකරුවෙකුගෙන් වසර 16 කට වඩා වැඩි කාලයක් සිට පැවතෙන රු.44,788 ක මුදලක් අයකර ගත නොහැකිව පැවතුනි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ඇ) 2011 හා 2012 වර්ෂවලදී බඩල්ගම කාරක සභාවේ පොහොර හා බිත්තර වී ඌනය වෙනුවෙන් අයවිය යුතු රු.461,639 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | |
|---|---|---|
| (ඈ) බියගම ගොවිජන සේවා කාරක සභාවේ 2019 හා 2020 වර්ෂවල තොග ඌනතාවය වූ රු.477,915 ක මුදල එවකට තොග භාරව කටයුතු කළ නිලධාරිනියගෙන් අයකර ගත නොහැකිව පැවතුනි. | අදාල නිලධාරිනිය දැනුවත් කර ඇති අතර අභ්‍යන්තර විගණනයේ වාර්තාව මේ වන විටත් ලැබී නැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

**3.3 කළමණාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2011 පෙබරවාරි 01 දිනැති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2011 ප්‍රකාරව පාවිච්චි කරන ලද උපපත්‍රිකා පොත් නැවත නිකුත් කිරීම සිදුකළ යුත්තේ මුලින් භාරදුන් පොත් ආපසු භාරගැනීමෙන් පසුව වුවද ගොවිජන සේවා කාරක සභා 05 ක උපපත්‍රිකා පොත් ලේඛනය පරීක්ෂා කිරීමේදී අක්කර බදු එකතු කිරීම සඳහා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් වෙත නිකුත්කර තිබූ කුවිතාන්සි පොත් නැවතත් කාරක සභාව වෙත භාරදීමෙන් තොරව තවත් කුවිතාන්සි පොතක් අදාල නිලධාරීන් වෙත භාරදී තිබූ බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | උපපත්‍රිකා පොත් පිළිබඳ පාලනයක් ඇති කළ යුතුයි. |
| (ආ) 2021 – 22 මහකන්නයේ මධ්‍යස්ථාන මට්ටමකින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් රු.100,000 න් ලබාදී තිබුණු මුදලින් ගොවිජන සේවා කාරක සභා 05 ක රු. 337,928 ක මුදලක් ඉතිරිව තිබුණි. මේ මුදල අදාල ව්‍යාපෘතිය සඳහා යොදාගෙන නොතිබුණු අතර, එය ආපසු ගෙවා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | ඉතිරි මුදල් ඉදිරියේදී කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදාගනිමි. | ඉතිරි මුදල කාබනික පොහොර ව්‍යාපෘතියට යොදා ගැනීමට හෝ ඉතිරි මුදල් ආපසු ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ගොවිජන සේවා කාරක සභා 20 කට අදාල මුළු පුරන්කුඹුරු ප්‍රමාණය අක්කර 5068 වන අතර, 2022/23 මහකන්නයේ වී හා අනෙකුත් බෝග වගාකරන ලද අක්කර ප්‍රමාණය අක්කර 1521 කට සීමාවී තිබුණි. | ජලය හිඟකම, වාරිමාර්ග ගැටලු, ගංවතුර තර්ජන, නාගරීකරණය අධිවේගී මාර්ග ඉදිකිරීම නිසා ඇතිවූ පාරිසරික ගැටලු නිසා පුරන්කුඹුරු වගාකිරීම් අවම මට්ටමක පැවතුණි. | ගොවිජන සංවර්ධන පනතේ 30 වගන්තිය ප්‍රකාරව සෑම ඉඩමක්ම වගාව සඳහා යෙදවිය යුතුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 17 ක වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එනු ලබන රු. 5,546,719 ක් වූ ලැබිය යුතු ශේෂ 55 අය කර ගැනීමටත් රු. 416,344 වූ ගෙවිය යුතු ශේෂ 02 ක් නිරවුල් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | යම් යම් ණය ශේෂ අයකර ගත හැකිබවත්, අයකරගත නොහැකි ණය ශේෂ සම්බන්ධයෙන් ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නා බව | මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම පැවත එන ලැබිය යුතු ශේෂ සහ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 07 ක කුබෝටා ට්‍රැක්ටර් රථ 01 ක්, අත්ට්‍රැක්ටර් 01, ගොයම් කපන යන්ත්‍ර 02 ක්, පැල තවාන් ගෘහ 02, දියර ඉසින යන්ත්‍ර 01 ක් නිෂ්කාර්යව පැවතුනි. | භාවිතයට ගත හැකි වත්කම් හා උපකරණ අවස්ථානුකූලව භාවිතයට ගැනීමටත් අනෙකුත් වත්කම් හා උපකරණ අපහරණය කිරීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට උපදෙස් ලබාදීමට කටයුතු කරමි. | භාවිතයට ගත හැකි වත්කම් හා උපකරණ උපයෝජනයට ගැනීමටත් අනිකුත් වත්කම් හා උපකරණ අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |

**3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 10 ක වාරිමාර්ග නඩත්තු හා මෙහෙයුම් ව්‍යාපෘති 89ක් සහ කාරක සභා 05 ක කෘෂිමාර්ග හා නිර්මිත ප්‍රතිසංස්කරණ කටයුතු 28 ක් සමාලෝචිත වර්ෂය තුල යෝජනා කර තිබුණද එම කාර්යයන් කිසිවක් ඉටුවී නොතිබුණි. | මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2022 වර්ෂයේ ප්‍රාග්ධන විෂයයන්ට අදාලව ප්‍රතිපාදන ලැබී නොමැති බැවින් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබුණද ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | වාරිකර්මාන්ත හා වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු හා ඉදිකිරීම් කටයුතු යාවත්කාලීනව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමණාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 26 කට අදාල කෘෂිකර්ම නිෂ්පාදන සහකාර වසම් 720 ක් සමන්විත වන අතර, එයින් වසම් 186 ක් සඳහාම කෘ.ප.නි.ස. සහකාරවරුන්ගේ පුරප්පාඩු පැවතුණි. | රජය මගින් නව බඳවා ගැනීම් සිදුනොකර සිටීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බැවින් මෙම තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ජනරාල් හට හැකියාව ලැබී නොමැති බව පෙන්වා දෙමි. | |

## 4. ගිණුම් කටයුතු යහපාලනය

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති අංක NG/SP/SGD/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ හා තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය " පිළිබඳව කාරක සභාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂයය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ලගාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ලගාවීම මැනබැලීම සඳහා වන දර්ශකයන්ද හදුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුර වූයේ ඒ පිළිබඳ දැනුවත්භාවයක් නොමැති බවයි. | තිරසාර සංවර්ධන ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු සංධිස්ථානයන්ද ඉලක්ක මත ලඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හදුනාගැනීමට කටයුතු කළ යුතුයි. |

## 05. ගොවිජන බැංකු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොවි සංවිධානවල තැන්පත් වර්ධනය කරගැනීමට ගොවිජන සේවා කාරක සභා 26 ම ගොවිජන බැංකු විසින් පියවර ගෙන නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නා බව. | ගොවි සංවිධානවල තැන්පත් වර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) ගොවිජන සේවා කාරක සභා 24 ක ගොවිජන බැංකුවල ණයගැතියන් 991 කට අදාල රු.23,398,566 ක් කල්ඉකුත්වූ ණය පැවති බව නිරීක්ෂණය විය. | මෙම ණය අයකර ගැනීම සඳහා ගොවිජන විනිශ්චය සභා මගින් හා අධිකරණ ක්‍රියා මාර්ග මගින් කටයුතු ඉදිරියටත් කරගෙන යාමට උපදෙස් ලබා දී ඇත. | 2012 පෙබරවාරි 29 දිනැති 4/2012 චක්‍රලේඛයට ප්‍රකාරව ණය මුදල් නියමිත දිනට අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |